කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

2020 පෙබරවාරි - සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව

ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව **DMAT E - 1025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. නාට්‍යමය ලක්ෂණ සහිතව ඉදිරිපත් කළ බෞද්ධ ධර්ම දේශනා ක්‍රම දෙකක් විස්තර කරන්න.

02. දේශීය ශාන්තිකර්ම අතරින් එකක් තෝරාගෙන එහි ඇති නාට්‍යමය අවස්ථා නම් කොට ඒවා රඟ දැක්වුන ආකාරය පැහැදිලි කරන්න.

03. සොකරි කතා පුවත කෙටියෙන් විස්තර කොට එය රඟ දැක්වීමට ගැමි කලාකරුවා භාවිත කළ රංග උපක්‍රම මොනවා දැයි පැහැදිලි කරන්න.

04. සම්ප්‍රදායික කෝලම් රැඟුමක චරිත වර්ග නම්කොට, එහි නාට්‍යමය ජවනිකා ඉදිරිපත් කෙරෙන අනුපිළිවෙල විමසුමට ලක් කරන්න.

05. චරිත හඳුන්වාදීම හා කතා පුවත ඉදිරිපත් කරන විලාසය කෙරෙහි අවධානය යොමු කරමින් පැරණි නාඩගමක රංග ආකෘතිය (ප්‍රාරම්භ පූර්ණ විරිදුව සිට මංගලම් ගීතය දක්වා) පැහැදිලි කරන්න.

06. "නූර්ති රඟ දැක්වුණේ සිංහල ගැමි නාටකවලට වඩා හාත්පසින්ම වෙනස් ස්වරූපයකිනි." නූර්තිවල අන්තර්ගතය හා ආකෘතිය සැලකිල්ලට ගනිමින් විමසා බලන්න.

07. ලංකා විශ්වවිද්‍යාල යුගයේ අනුවර්තන හා පරිවර්තන නාට්‍ය නිෂ්පාදන මගින් මෙරට රංග කලාවේ ඇති වූ දියුණුව කවරාකාර දැයි විමර්ශනය කරන්න.

08. 1956 වසරෙන් පසු දේශීය රංග කලාවේ ප්‍රබෝධයක් ඇතිවීමට බල පෑ හේතු සාධක මොනවා දැයි පරීක්ෂා කරන්න.

09. පහත සඳහන් නාට්‍යකරුවන් අතරින් එක් අයකු තෝරාගෙන, ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාවේ ප්‍රගමනයට ඔහුගෙන් සිදු වූ දායකත්වය ඇගයීමට ලක් කරන්න.

(i) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

(ii) හෙන්රි ජයසේන

(iii) දයානන්ද ගුණවර්ධන

(iv) ආචාර්ය ජයලත් මනෝරත්න

*************************